දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை
District Secretariat - Hambantota
පළමු මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට. 1ஆம் மாடி, மாகம் ருகுணுபுர நிர்வாக கட்டடத் தொகுதி, சிரிபோபுர, ஹம்பாந்தோட்டை 1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"செழுமையான எதிர்காலத்திற்காக"
" For a prosperous future"

මගේ අංකය / எனது இலக்கம் / My No: DSH/DPS/7/DCC/Report/2026
ඔබේ අංකය / உமது இலக்கம் / Your No:
දිනය / திகதி / Date: 2026.03.19

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2026.03.12</u>**

2026.03.12 වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යයන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතන වල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථා වලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය මා වෙත DCC Hambantota WhatsApp සමූහය වෙත හෝ dpshambantota@gmail.com වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04. තවද, මෙම වාර්තාව www.hambantota.dist.gov.lk දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබාගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

දුරකථන /ෆැක්ස් :- 0472256234
විද්‍යුත් ලිපිනය :- dpshambantota@gmail.com

පිටපත් -

1.හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස.
2.ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
3.ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / District Secretary | 047 2256235 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(පාලන) / மேலதிக மாவட்ட செயலாளர் (நிர்வாகம்) / Additional District Secretary (Admin) | 047 2256232 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) / மேலதிக மாவட்ட செயலாளர் (காணி) / Additional District Secretary (Land) | 047 2256002 | ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant | 047 2256246 |
| අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / பணிப்பாளர் (விவசாயம்) / Director (Agriculture) | 047 3628890 | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) / பணிப்பாளர்(திட்டமிடல்) / Director (Planning) | 047 2256234 | සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மாவட்ட செயலாளர் / Assistant District Secretary | 047 2256945 | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer | 047 2256285 |
| කාර්යාලය / அலுவலகம் / Office | 047 2256174 | ෆැක්ස් / தொலை நகல் / Fax | 047 2256235 047 2256247 | ඊ මේල්/ மின்னஞ்சல் / email : moha.dist.hambantota@gmail.com | | වෙබ් අඩවිය / இணையத்தளம் / Web site : www.hambantota.dist.gov.lk | |

# හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම
## 2026.03.12

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර මහාචාර්ය සුසිරිපාල මානවඩු මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු සියලුම දේශපාලන නායකත්වයෙන් මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2026.03.12 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් මෙන්ම අභිනවයෙන් පත් වූ දකුණු පළාත් ආණ්ඩුකාරතුමන් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලු දෙනාම දිස්ත්‍රික් ලේකම්තුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව, ගරු සභාපතිතුමා විසින් පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීමෙන් පසු රැස්වීම් වාර්තාව සභා සම්මත කර න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදී. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | **2026.01.29 දිනැති සම්බන්ධීකරණ රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම.** | | | |
| 1.1 | සංවර්ධන ව්‍යාපෘති සඳහා පස් ප්‍රවාහනය | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා දී ඇති බලපත්‍ර අවභාවිතා කරමින් පස් ප්‍රවාහනය කරන බවට කරුණු ඉදිරිපත් විය. | එම බලපත්‍ර අවභාවිතා කරමින් පස්, වැලි ප්‍රවාහනය කරන පිරිස් සඳහා නීතිය ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| 1.2 | වැලි කැණීම හේතුවෙන් පරිසර හානි සිදුවීම වලක්වා ගැනීම | වැලි කැණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් අනතුරුව පසු විපරම් කිරීම අදාල ආයතන සතු වගකීමක් බවත් එසේ බලපත්‍ර ලබාදුන් ස්ථාන වල නියාමනයකින් තොරව මෙම කටයුතු සිදු කරන බවට කරුණු ඉදිරිපත් විය.<br><br>සංවේදී කලාප ලෙස නම් කළ ප්‍රදේශ තුළ ද නැවත බලපත්‍ර ලබා දී ඇති බවටත් වලවේවත්ත, දෙබරගස්මුල්ල වැනි ස්ථාන නැවත වැලි කැණීම සඳහා ඉල්ලීම් කර තිබෙන බවට ද කරුණු ඉදිරිපත් විය. වැලි කැපීම සඳහා වන ඉල්ලීම් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වලදී සාකච්ඡා නොවන බවටත් කරුණු ඉදිරිපත් විය.<br><br>ප්‍රාදේශීය සභා හා පළාත් සභා මාර්ගයන්හි ඉහළ ධාරිතාවයකින් යුතුව පස් හා වැලි ප්‍රවාහනය කිරීම තුළින් මාර්ගවලට සිදුවන හානිය සම්බන්ධව කරුණු ඉදිරිපත් විය. | අදාල ස්ථාන දෛනිකව නිරීක්ෂණය සිදුකරන ලෙසත්,නියාමනයකින් තොරව වැලි කපන ස්ථාන වේ නම් නීතිමය පියවර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී.<br>ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශයකින් තොරව හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතියකින් තොරව ලබාගත් සියලුම බලපත්‍ර අත්හිටුවන ලෙසට හා නව බලපත්‍ර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු නිර්දේශයකින් තොරව ලබා නොදෙන ලෙස උපදෙස් දෙන ලදී.<br>පස් වැලි ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් අදාල පළාත් පාලන | දිස්ත්‍රික්කයේ අදාල සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල<br><br>ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය |





බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | ආයතන දැනුවත් කිරීම හා පළුදු වූ මාර්ග පිළිබඳව භූවිද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය දැනුවත් කර එය සකස් කරගත යුතු බවට උපදෙස් ලබාදෙන ලදී. | |
| 1.3 | ධීවර වරායන් ආශ්‍රිතව ඩෙංගු වසංගතය ව්‍යාප්තිය | හම්බන්තොට, කුඩාවැල්ල, තංගල්ල ඇතුළු ධීවර වරායන් ආශ්‍රිතව නවතා තිබෙන ධීවර යාත්‍රා මගින් ඩෙංගු මදුරුවන් බෝවීම වලක්වා ගැනීම සඳහා අධීක්ෂණ කටයුතු දෛනිකව සිදුකරන බවට කරුණු ඉදිරිපත් විය. | එම කටයුතු තවදුරටත් සිදුකරගෙන යන ලෙසත් නිසි පරිදි කටයුතු නොකරන පිරිස් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් දෙන ලදී | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>සහකාර අධ්‍යක්ෂ ධීවර<br><br>කළමනාකරුවන්, ධීවර වරාය |
| 1.4 | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලස්ම | මේ සම්බන්ධව 2026.04.06 වන දින වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවට කරුණු ඉදිරිපත් විය. ග්‍රාම නිලධාරී විසින් ඉඩම් හඳුනාගැනීමේ වැඩමුළුව අයිලාශ් වැඩසටහන ඉදිරියට පවත්වාගෙන යන ලෙසටත් මිනින්දෝරු දෙපාර්තමේන්තුව හරහා වැඩමුලු හා දැනුවත්කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජනා විය. | මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැඩසටහන් පවත්වන ලෙසට උපදෙස් දෙන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>සහකාර අධ්‍යක්ෂ ඉඩම් පරිහරණ |
| 1.5 | රුහුණු රිදියගම කෘෂි පාරිසරික ගොවිපළ අයත් ඉඩම පවරා ගැනීම | රිදියගම නිවර්තන නිවාසය සඳහා අත්පත් කරගත් අක්කර 25 ඉඩමක දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොවිපළක් පවත්වා ගෙන යන අතර දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්මේන්තුවට මෙම ඉඩම් කොටස පවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. එහෙත් මෙම ඉඩම සම්බන්ධව ගරු අධිකරණය තුළ නඩු කටයුතු සිදුවෙමින් පවතින බවත්, කෙසේ වෙතත් අත්පත් කරගැනීමේ අරමුණින් බැහැරව ඉඩම් නිදහස් කිරීමේ හැකියාවක් ප්‍රාදේශීය ලේකම්ට නොමැති බවත් සඳහන් කරන ලදී. ඉඩමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත ලබා ගෙන පසුව සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා පළාත් කෘෂි කර්ම අමාත්‍යාංශය වෙත පවරාදීම සිදුකළ යුතු බවට කරුණු ඉදිරිපත් විය. | අදාල ආයතන සම්බන්ධ වී ඉඩමේ අයිතිය නිරවුල් කර ගන්නා ලෙස උපදෙස් දෙන අතර මේ සම්බන්ධව කෙටි වාර්තාවක් සකස් කර ගරු අධිකරණය සමඟ සාකච්ඡා කර තීරණ ගැනීම සුදුසු ලෙස උපදෙස් දෙන ලදී. | ලේකම් දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය<br><br>ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට |
| 1.6 | ගිනිගල් ආර වැව දක්වා ජලය ලබා ගැනීම සඳහා ඇළ මාර්ගයක් සකස් කර ගැනීම | 2026 වසරේ ඇළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා මෙම ව්‍යාපෘතිය ද ක්‍රියාත්මක කිරීමේ හැකියාව සම්බන්ධව නිරීක්ෂණ කටයුතු සිදුකරන බවට කරුණු ඉදිරිපත් විය. | මෙම ව්‍යාපෘති යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් හම්බන්තොට |



ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 1.7 | සූරියවැව මයුරපුර කොට්ඨාසයේ තැලවිල්ල අක්කර 05 භූමිය පෞද්ගලික ආයතනයකට බදු මත පැවරීම | මෙම භූමිය ආදාහනාගාරයක් සඳහා ලබාදුන්න ද මේ වන තෙක් කිසිදු ප්‍රයෝජනයක් ලබානොගැනීම නිසා බදු පදනම මත පෞද්ගලික ඇහලුම් ආයතනයකට ලබා දීමට කටයුතු කිරීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර සාකච්ඡා කරන ලද බවත් එහි අනුමැතිය මේ සඳහා ලැබුණු අතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කළ බවට කරුණු ඉදිරිපත් විය. | මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට නීත්‍යානුකූලව පවරා දීමෙන් පසු ප්‍රාදේශීය සභාව හරහා පෞද්ගලික ආයතනය වෙත පැවරීමට දිස්ත්‍රික් සම්බන්දීකරණ කමිටුවේ දී අනුමැතිය ලබාදෙන ලදී. | සහකාර කොමසාරිස් පළාත් පාලන<br><br>ප්‍රාදේශීය ලේකම් සූරියවැව |
| 1.8 | තෝරාගත් වැව් කිහිපයක මැටි ඉවත් කිරීම සඳහා අවසර ඉල්ලා සිටීම | තිස්සමහාරාම මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් කෞතුකාගාරයක් ගොඩනැගීමට කටයුතු කරන අතර ඊට අවශ්‍ය ගඩොල් සපයා ගැනීම සඳහා ගඩොල් කර්මාන්තයට අවශ්‍ය මැටි ලබා ගැනීම සඳහා තෝරාගත් වැව් කිහිපයක මැටි ඉවත් කිරීමට අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් විය. | අවශ්‍ය ඉල්ලීම අනුව තිස්ස වැව තුළින් අප්‍රේල් 02 දක්වා මැටි ලබා ගැනීමේ කටයුතු සිදුකරන බවට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාම |
| 02. | **2026 වසරේ සංවර්ධන වැඩසටහන් පිළිබඳ ඉදිරිපත් කිරීම.** | | | |
| 2.1 | විමධ්‍යගත අයවැය වැඩසටහන 2026 | 2026 වර්ෂය සඳහා විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා රු. මිලියන 10ක් වෙන්ව ඇති පවත් ඒ අනුව දිස්ත්‍රික්කයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන් රු.මි. 70ක් ලැබී ඇති බවත් ජාතික ලැයිස්තු ගරු පා.ම. නාමල් රාජපක්ෂ මැතිතුමා විසින් රු.මි.07ක් මෙම දිස්ත්‍රික්කයට වෙන් කර දී ඇති බවත් ඒ අනුව දැනටමත් ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව සඳහා යෝජනා කරන ලද රු.මි.60.70 ට අදාලව යෝජනා 119ක් යොමු කර ඇති බවත් දක්වන ලදී. එම යෝජනා අතුරින් චක්‍රලේඛයට ගැලපෙන පරිදි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු නිර්දේශය සහිතව ඉදිරිපත් වූ යෝජනා අතුරින් රු.මි. 47.6 කට අදාල යෝජනා 88 ක් අද දින අනුමැතිය සඳහා දිස්ත්‍රික් සම්න්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන බව දන්වන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |

නිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|

| ගරු අමාත්‍යතුමාගේ/ගරු මන්ත්‍රීතුමාගේ නම | ලබාදුන් යෝජනා ගණන | මුදල රු.මි. | අනුමත වූ යෝජනා ගණන | අනුමත වූ මුදල රු.මි. |
|---|---|---|---|---|
| ගරු හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරුවේ සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා | 09 | 10.00 | 08 | 9.50 |
| පළාත් සභා හා පළාත් පාලන ගරු නියෝජ්‍ය අමාත්‍ය ප්‍රභා රුවන් සෙනරත් මැතිතුමා | 23 | 10.00 | 18 | 7.50 |
| ඉඩම් හා වාරි මාර්ග ගරු නියෝජ්‍ය අමාත්‍ය අරවින්ද සෙනරත් විතාරණ මැතිතුමා | 31 | 10.00 | 11 | 3.80 |
| හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය සාලිය සඳරුවන් මදරසිංහ මැතිතුමා | 08 | 10.00 | 07 | 8.00 |
| හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අතුල වෙදගොඩ හේවගේ මැතිතුමා | 24 | 10.00 | 23 | 9.80 |
| හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ඩී.වී. චානක මැතිතුමා | 22 | 10.00 | 19 | 9.00 |
| හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිප් වෙදආරච්චි මැතිතුමා | 0 | - | 0 | 0 |
| ජාතික ලැයිස්තු ගරු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මැතිතුමා | 02 | 0.70 | 0 | 0 |
| **එකතුව** | **119** | **60.70** | **86** | **47.60** |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.2 | ප්‍රජා ශක්ති ජාතික වැඩසටහන | මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ ආවරණ අනුමැතියට යටත්ව අමාත්‍යාංශ අනුමැතිය සඳහා යෝජනා ඉදිරිපත් කර ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලදී | දිස්ත්‍රික් ලේකම් අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී වසම්/ප්‍රජා සංවර්ධන සභා ගණන | වෙන් කරන ලද මුදල රු.මි. | අමාත්‍යාංය වෙත යොමු කරන ලද සංවර්ධන යෝජනා සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | කටුවන | 56 | 83.43 | 56 |
| 2 | වලස්මුල්ල | 53 | 72.49 | 53 |
| 3 | වීරකැටිය | 60 | 76.24 | 60 |
| 4 | ඕකෙවෙල | 27 | 40.55 | 27 |
| 5 | බෙලිඅත්ත | 71 | 89.74 | 71 |
| 6 | තංගල්ල | 72 | 94.12 | 13 |
| 7 | අඟුණුකොලපැලැස්ස | 51 | 73.17 | 51 |
| 8 | අම්බලන්තොට | 55 | 86.28 | 55 |
| 9 | හම්බන්තොට | 30 | 59.90 | 30 |
| 10 | සූරියවැව | 21 | 51.47 | 21 |
| 11 | තිස්සමහාරාම | 44 | 89.64 | 44 |
| 12 | ලුණුගම්වෙහෙර | 36 | 64.00 | 36 |
| | **එකතුව** | **576** | **881.09** | **563** |



ඩී. එල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.3 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2026 | මෙම වැඩසටහන යටතේ පහත පරිදි ප්‍රතිපාදන වෙන් කර ඇති බවත් ඉල්ලුම් කර ඇති සංශෝධන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ආවරණ අනුමැතියට යටත්ව අමාත්‍යාංශයට යොමු කර ඇති බවත් දක්වන ලදී. | ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කල යෝජනා සඳහා අනුමැතිය ලබාදෙමින් වැඩ කටයුතු කඩිනමින් කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අනුමත ව්‍යාපෘති ගණන | ලැබී ඇති ප්‍රතිපාදන රු.මි. |
|---|---|---|
| කටුවන | 08 | 20.80 |
| වලස්මුල්ල | 11 | 20.80 |
| වීරකැටිය | 10 | 20.80 |
| ඕකෙවෙල | 10 | 20.80 |
| බෙලිඅත්ත | 07 | 20.80 |
| තංගල්ල | 02 | 21.00 |
| අඟුණුකොලපැලැස්ස | 02 | 20.80 |
| අම්බලන්තොට | 10 | 20.80 |
| හම්බන්තොට | 09 | 20.80 |
| සූරියවැව | 08 | 20.80 |
| තිස්සමහාරාම | 05 | 21.00 |
| ලුණුගම්වෙහෙර | 06 | 20.80 |
| එකතුව | 88 | 250.00 |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | වගකීම |
|---|---|---|---|
| 03. | පළාත් සභා සංවර්ධන වැඩසටහන යටතේ 2026 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය | සියළු ව්‍යාපෘති සම්බන්ධව මෙහිදී ප්‍රගතිය විමසීමක් සිදු කරන ලද අතර 2026.02.28 දිනට දැනුම් දෙන ලද ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කරන ලදී. | ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br><br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් (දකුණු පළාත)<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |

| අමාත්‍යාංශය | අනුමත ප්‍රතිපාදන මුදල රු.මි. | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය | 707.75 | 215 | 112 | - | - |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 438.70 | 164 | 44 | 4 | - |
| ධීවර අමාත්‍යාංශය | 209.78 | 81 | 81 | | 1.65 |
| ක්‍රීඩා අමාත්‍යාංශය | 202.04 | 60 | 46 | - | - |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 457.54 | 66 | 52 | 8 | 0.04 |

බිමල් ඉන්දුපාල
දිස්ත්‍රික් ලේකම් / දිසාප...
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 04 | සෞඛ්‍ය අංශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු. | හම්බන්තොට මහ රෝහල සඳහා තට්ටු 05ක ගොඩනැගිල්ලක් සහ මානසික ප්‍රතිකාර ඒකකයක අවශ්‍යතාවය පැහැදිලි කරන ලද අතර රෝහලට ඇතුල්වීමේ මාර්ගයේ පවතින අනතුරුදායක තත්තවය පිළිබඳ කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව කඩිනමින් අවධානය යොමු කර කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | රෝහල් අධ්‍යක්ෂ හම්බන්තොට මහ රෝහල<br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය |
| | | ආයුර්වේද රෝහල් තුළ භාවිතා නොකළ යකඩ ඇඳන් 50ක් පමණ වැඩිපුර පවතින බවටත් මෙම ඇඳන් අවශ්‍ය ආයතන වෙත ලබා දීමට හැකියාවක් ඇති බවට කරුණු ඉදිරිපත් විය. | හම්බන්තොට චමල් රාජපක්ෂ ආයුර්වේද රෝහලේ පංචකර්ම වාට්ටුවෙහි ඇඳන් වල අවශ්‍යතාවයක් පවතින බැවින් මෙම ඇඳන් 50 එයට ලබා දීමට උපදෙස් දෙන ලදී. | පළාත් අයුර්වේද කොමසාරිස් |
| | | මේ වන විට මිද්දෙනිය, කටුවන, ගෝණදෙණිය, රන්න, තලාව ආදී ප්‍රාදේශීය රෝහල් රැසක ගිලන් රථ ප්‍රමාණවත් පරිදි නොවන බවත් එම රථ 11ක් පමණ අලුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතින බවටත් මෙය ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පවතින ප්‍රමාදයක් බවට ද කරුණු ඉදිරිපත් විය. | අලුත් වැඩියා කටයුතු සම්බන්ධව ප්‍රමාදවීම් පිළිබඳ සොයාබලා පළාත් සෞඛ්‍ය සේවයට වෙන් කර ඇති ප්‍රතිපාදන භාවිතා කර කඩිනමින් කටයුතු කරන ලෙසට උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 05 | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම. | මෙම වසර වන විට දිස්ත්‍රික්කය තුළ මාර්ග රිය අනතුරුවල වර්ධනයක් පවතින අතර පෙබරවාරි මස අවසන් වන විට රිය අනතුරු 20ක් ලෙස වාර්තා වී ඇති බවත් මෙයට ප්‍රධාන හේතුව ලෙස මත්ද්‍රව්‍ය භාවිතා කරන රියදුරන් බවටත් කරුණු ඉදිරිපත් විය. මත්ද්‍රව්‍ය භාවිතා කරන රියදුරන් හඳුනා ගැනීමේ කටයුතු මෙන්ම මත්ද්‍රව්‍ය වැඩි වශයෙන් භාවිතා කරන මාර්ග පිළිබඳ අවධානය යොමු කොට නීතිය ක්‍රියාත්මක කරන බවට කරුණු ඉදිරිපත් විය. | මේ සියලු කාරණා සම්බන්ධව පරීක්ෂණ කටයුතු කඩිනමින් අඛණ්ඩව සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| | | තංගල්ල වරාය ආශ්‍රිත නව කප්පම් කණ්ඩායමක් ක්‍රියාත්මක වෙමින් පවතින බවටත් මේ නිසා ධීවරයන්ගේ ජීවිතවලට අවදානමක් මතු වී ඇති බවට කරුණු ඉදිරිපත් වූ අතර මේ වනතෙක් මේ පිළිබඳ පොලිසියට කිසිඳු වාර්තාවක් හෝ පැමිණිල්ලක් ලැබී නොමැති බවට කරුණු ඉදිරිපත් විය.<br>එමෙන්ම දවල් 11න් පසු මෙම වරාය තුළ මත්ද්‍රව්‍ය භාවිතා කරන බවටත් මෙහි අධික දූර්ගන්ධයක් පැතිර යන බවටත් කරුණු ඉදිරිපත් විය. | වරාය පිරිසිදු කිරීමේ කටයුතු පිළිබඳ තවදුරටත් අවධානය යොමු කරන ලෙසත් මේ සම්බන්ධව අධ්‍යයනය කර වාර්තාවක් ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී. | වරාය කළමනාකරු තංගල්ල |



දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 06 | **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මඟින් ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| 6.1 | මිද්දෙණිය ප්‍රාථමික විද්‍යාලයේ ක්‍රීඩා පිටිය නවීකරණය කර, වොලිබෝල් ක්‍රීඩා පිටිය ආරක්ෂිත දැල් ආවරණ සහිතව සකස් කිරීම සහ මිද්දෙණිය මහා විද්‍යාලයේ ධාවන පථය සකස් කිරීම | මෙම පාසල් වල ක්‍රීඩා පිටි සකස් කර පාසල් දරුවන් හට ක්‍රීඩා කිරීමට සුදුසු පරිදි පහසුකම් සැපයීම සහ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ සංකල්පයක් වන ක්‍රීඩා සංස්කෘතියක් බිහිකිරීම යනවැඩසටහන යටතේ මිද්දෙණිය නගරය ආශ්‍රිත තරුණ පිරිසට ක්‍රීඩා පහසුකම් සැලසීම අරමුණ කරගනිමින් ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී. තවද මේ සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ අනුමැතිය සහිතව ක්‍රීඩා අමාත්‍යාංශයට දැනුම් දීම කලයුතු බවට යෝජනා විය. | මෙහිදී පාසල් භූමිය වෙත හානියක් නොවන පරිදි කටයුතු කරන ලෙස සඳහන් කරමින් අනුමැතිය ලබාදුන් අතර අදාල අංශ දැනුවත් කර ප්‍රතිපාදන ලබා ගනිමින් ඉදිරි ක්‍රියාමාර්ග සිදුකරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>ප්‍රාදේශීය ලේකම් කටුවන |
| 6.2 | මිද්දෙණිය බස් නැවතුම්පොළෙහි දෙමහල් ගොඩනැගිලි මඟින් වැටෙන ජලය හේතුවෙන් සිදුවන ගැටළු සඳහා විසඳුමක් ලෙස වහල් දෙක තනි වහලක් බවට සැකසීම | මෙය නිසි සැලසුමකට අනුව ඉදිකර නොමැති හේතුවෙන් දෛනිකව පැමිණෙන විශාල මගීන් පිරිසක් ගැටලුවලට මුහුණ පාන බවත් මෙකී ගැටලු විසඳීම සඳහා දිගු කාලීන සැලසුමක් හඳුනාගෙන ඊට අනුව නවීකරණය කළයුතු බවට යෝජනා ඉදිරිපත් විය. | සුදුසු සැලසුමක් සකස් කර ඊට ඇස්තමේන්තුවක් ද සමඟින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමැතියකින් යුතුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | සභාපති මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය<br><br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය |
| 07 | **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| 7.1 | වලව ගඟේ මෝය කට ඇහිරීම නිසා ඇතිවන ජල ගැල්මෙන් පහත් බිම් කුඹුරු විනාශ වීම | මේ සඳහා ගඟ දෙපස මෝය අසළ පවතින ගල් පරය සිදුරුකර ස්ථිර ජලය බැස්සවීමේ ක්‍රමය අධ්‍යයනය කරමින් පවතින අතර එම ක්‍රමය වඩාත් සුදුසු බවට යෝජනා ඉදිරිපත් විය. | එම යෝජනාව කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | අධ්‍යක්ෂ වාරිමාර්ග හම්බන්තොට |
| 08 | **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම** | | | |
| 8.1 | IRDCRP ව්‍යාපෘති යටතේ සිදුකිරීමට යෝජිත අත්‍යවශ්‍ය කර්මාන්ත | මෙම ව්‍යාපෘතිය අධීක්ෂණ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කරන අතර ඉතිරි සියලු කටයුතු ලෝක බැංකුව මඟින් සිදු කරන බවට කරුණු ඉදිරිපත් විය. | අනුමැතිය ලබාදෙන ලදී | වාරිමාර්ග අධ්‍යක්ෂ හම්බන්තොට |
| 8.2 | CResMPA සඳහා වාරි වැඩසටහන් ඉදිරිපත් කිරීම | ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් දේශගුණික බලපෑම අවම කිරීමේ බහු අදියර වැඩසටහනට අයත් වාරි වැඩසටහන් සඳහා අනුමැතිය ලබා ගැනීම | අනුමැතිය ලබාදෙන ලදී. | වාරිමාර්ග අධ්‍යක්ෂ හම්බන්තොට |

...ල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 8.3 | IRDCRP ව්‍යාපෘති යටතේ සිදුකිරීමට නියමිත යෝජිත ව්‍යාපෘති | වැලිගත්ත වැව රු.මි. 25ක් ද වෙහෙරගල වැව රු.මි. 50 ක් ද වශයෙන් ව්‍යාපෘති වලට අදාල ඇස්තමේන්තු ප්‍රධාන කාර්යාලය වෙත යවා ඇති බවත් මේ ව්‍යාපෘති තුළින් වී වගාව සහ අතුරු භෝග වගාව සඳහා බලපාන බවටත් මෙහි අධීක්ෂණ කටයුතු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය හරහා සිදුවන බවටත් කරුණු ඉදිරිපත් විය. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන දිස්ත්‍රික් සම්බන්ධීකරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් හම්බන්තොට |
| 8.4 | 2026 වර්ෂයේ සුළුවාරි මාර්ග යෝජනා ඉදිරිපත් කිරීම | 2026 වර්ෂයට අදාළව ක්‍රියාත්මක කිරීමට යෝජිත සුළු වාරිමාර්ග ව්‍යාපෘති ඉදිරිපත් කිරීම. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කළ යෝජනා සඳහා අනුමැතිය ලබාදෙන ලදී. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් හම්බන්තොට |
| 8.5 | 2026 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ ඉදිරිපත් කර ඇති යෝජනා | දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් මෙම දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති අතර ගහේ යාය පෙර පාසලට වැසිකිලි පද්ධතියක් සඳහා ලබාදෙන රු.ලක්ෂ 06 ක මුදල උඩුවිල පෙර පාසලෙහි වැසිකිළි පද්ධතියක් සකස් කිරීම සඳහා ලබාදෙන ලෙසට ඉල්ලීම් කරන ලදී. | ව්‍යාපෘති සංශෝධනය පළාත් සභාව හරහා සිදු කරගන්නා ලෙස උපදෙස් දෙමින් සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබා දෙන ලදී | පළාත් පාලන කොමසාරිස් දකුණු පළාත |
| 8.6 | ශ්‍රී ලංකාවේ ප්‍රථම අන්තරායකර කාර්මික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා දිගු කාලීන බදු පදනම මත ඉඩමක් ලබා ගැනීම | කර්මාන්ත ශාලා තුළින් බැහැර වන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයකට අදාලව හම්බන්තොට වරාය ඉදිරිපස අක්කර 02ක ඉඩමක් ලබා ගැනීම සම්බන්ධව ඉල්ලීම් කරන ලදී | මහවැලි අධිකාරිය යටතේ මේ පිළිබඳ අධ්‍යයනයක් සිදු කර වාර්තාවක් ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී. | නේවාසික ව්‍යාපාර කළමනාකරු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 8.7 | ඔරුකෙම් ගල කළුගල් කැඩීමේ ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා අවසර ඉල්ලීම | මේ ආසන්නයේ සෝලා ව්‍යාපෘතියක් සහ පුරාවිද්‍යාත්මක ස්මාරක පවතින බැවින් ඒ සඳහා බලපෑමක් ඇති විය හැකි බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව අධ්‍යයනයක් සිදුකර කඩිනමින් වාර්තාවක් ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය |

දිස්ත්‍රික් ලේකම / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 8.8 | 2026 වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත " මිතුරු පුරවර හදන පියවර" වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා අනුමැතිය ඉල්ලීම | කිරින්ද ඔරුවැල්ල සඳහා රු.මි. 20 සහ බෙලිඅත්ත නගර අලංකරණය සඳහා රු.මි.05 වශයෙන් වෙන් කර ඇති බවත් මේ සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා දී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.<br><br>වලස්මුල්ල බස් නැවතුම්පළ භූමියට අදාළ ඉඩම නිරවුල් කරගැනීම සහ ඉන්ධන පිරවුම්හල ඉදිකර ගැනීම සඳහා නගර සැලසුම් අවශ්‍ය බව දක්වන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ අනුමැතිය ලබාදෙන ලදී.<br><br>වලස්මුල්ල වෙනුවෙන් සකස් කර ඇති නගර සැලසුම ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය හම්බන්තොට |
| 8.9 | වැලි නිස්සාරණ යන්ත්‍රය අවශ්‍ය ස්ථානයන්ට රැගෙන යාමට සහ පස් ඉවත් කර ගැනීම සඳහා අනුමැතිය ඉල්ලීම | අනුමැතිය ලබාදෙන ලදී | | ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට<br><br>ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු<br>භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය |
| 8.10 | 2026 වර්ෂයේ ප්‍රාථමික පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ සංවර්ධනය කිරීමට යෝජිත පාසල් නාම ලේඛනය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම | අනුමැතිය ලබාදෙන ලදී | | දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 09 | සාකච්ඡා කරන ලද වෙනත් කරුණු | | | |
| 9.1 | ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩුව සඳහා පළාත් පාසල්වලින් ගුරුවරු අනුයුක්ත කිරීම | තංගල්ල මහ විද්‍යාලය, හම්බන්තොට ශාන්තමේරි ජාතික පාසල ආදී පාසල් වල පවතින ගුරු පුරප්පාඩු සඳහා පළාත් සභා පාසල් වලින් ගුරුවරුන් අනුයුක්ත කිරීම නිසා පළාත් සභා පාසල් වල ගැටළුවක් තිබෙන බවට කරුණු ඉදිරිපත් විය. මෙහිදී පළාත් සභා පාසල්වල ගුරුවරුන් අතිරික්තයක් පවතී නම් එම සේවාව ජාතික පාසලට අවශ්‍යව පවතී නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක හරහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය හරහා ක්‍රියාත්මක වීම දැනට සිදුවන බවටත් මේ වන විට හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ජාතික පාසල් සඳහා ගුරුවරුන් 39ක් අනුයුක්ත කර ඇති බවට කරුණු ඉදිරිපත් විය. | ජාතික පාසල්වලට ගුරුවරුන්ගේ පවතින පුරප්පාඩු සම්බන්ධව රේඛීය අමාත්‍යාංශය වෙත අවධානය යොමු කිරීමට අදාළ කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 9.2 | තංගල්ල නගරය සංචාරක පුරවරයක් ලෙස ගැසට් කිරීමට අදාළව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා ගැනීම | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලදී. | | සභාපති<br>තංගල්ල නගර සභාව |

විමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 9.3 | හම්බන්තොට තානායම් පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීම සම්බන්ධව | 2025.07.07 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹී තීරණයකට අනුව හම්බන්තොට තානායම ඇතුළු තානායම් පරිශ්‍ර 44 ක් ආයෝජකයින් මඟින් සංවර්ධනය කිරීම පිණිස රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් නිදහස් දීමනාවක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරාදීම පිණිස තීරණය කර තිබෙන බවත් මේ හේතුවෙන් හම්බන්තොට මහා නගර සභාව සතු ප්‍රධාන ආදායම් මාර්ගයක් වශයෙන් පවතින මෙම තානායම් ගොඩනැගිල්ලෙන් නාගරික ජනතාව වෙත ඉටු කරනු ලබන සේවාවන් තව දුරටත් අඩුවීමේ අවදානමක් පවතින අතර එය විධිමත් බදු ගිවිසුමක් මගින් තෝරාගනු ලැබූ ආයෝජකයා කෙරෙහි ද බලපෑමක් වන බවට කරුණු ඉදිරිපත් විය. | කැබිනට් තීරණ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමටුව හරහා වෙනස් කළ නොහැකි බවට උපදෙස් දෙන ලදී. | ගරු නගරාධිපති හම්බන්තොට<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය |
| 9.4 | ලුනුගම්වෙහෙර රාජපක්ෂ මාවතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක් ව්‍යාපාරිකයෙක් සතු කර ගැනීම | මෙම ඉඩම් සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ කටයුතු කිරීම සඳහා නඩු පැවරීම් සිදුකර තිබෙන බවත් පොලිසිය මේ සම්බන්ධව නීතිමය පියවර ගන්නා බවට ද කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව කටයුතු කඩිනමින් සිදුකරන ලෙස උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල<br><br>දිසාවන නිලධාරී හම්බන්තොට |
| 9.5 | තිස්සමහාරාම බල ප්‍රදේශයේ විදුලි වැට සකස් කිරීම | මෙම ප්‍රදේශයේ විදුලි වැට කි.මී.5ක ප්‍රමාණයක් සකස් කිරීම සඳහා ලබාදුන් ප්‍රතිපාදන මගින් එම කටයුතු සිදු කිරීම ප්‍රමාද වන බවට කරුණු ඉදිරිපත් වූ අතර ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුකර තිබෙන බවත් මේ සඳහා වනජීවී අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත අවසරයක් අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් විය. | මීට අදාළ අනුමැතිය හා නිර්දේශය වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලබා ගැනීමට කඩිනමින් කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ වනජීවී (දකුණ)<br><br>දිසාවන නිලධාරී හම්බන්තොට |
| 9.6 | දැය නන්වන සපිරි ගමක් ප්‍රජා ඵලදායිතා ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය 2025-2027 | ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන මෙයට අදාල ජාතික වැඩසටහන කළුතර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වෙන බවත් හම්බන්තොට දිස්ත්‍රික් සමාරම්භක වැඩසටහන තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැදිගම්විල ග්‍රාම නිලධාරී වසමේ 2026.03.16 දින පෙ.ව. 10.00 ට පැවැත්වීමට නියමිත බවට කරුණු ඉදිරිපත් විය. | මේ සියලු දෙනාගේම සහයෝගය ලබාදෙන ලෙස උපදෙස් ලබාදෙන ලදි. | ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාම |
| 9.7 | පොහොර හිඟය | යල කන්නයේ ගොවිතැන් කටයුතු ආරම්භ කර නොමැති අතර ගෝලීයව පවතින යුධමය තත්වය හේතුවෙන් පොහොර ගබඩා කිරීම අනවශ්‍ය ලෙස සිදු කිරීම නිසා මෙවැනි ගැටළුවක් පවතින බවට මතයක් | පවතින ගෝලීය අර්බුධ හමුවේ පොහොර අනවශ්‍ය ලෙස ගබඩා කර ඇති අය හඳුනාගෙන නීතිමය පියවර ගන්නා | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල<br><br>සහකාර අධ්‍යක්ෂ පොහොර |



විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | තිබුණ ද එවැනි තත්වයක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | ලෙස උපදෙස් දෙන ලදී. | |
| 9.8 | නෝනගම කාය වර්ධන මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම | නෝනගම කාය වර්ධන මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පසුගිය වසරේ ද ඇස්තමේන්තු සකස් කල අතර ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එය අළුත්වැඩියා කරගැනීමට නොහැකි වූ බවත් එය භාවිතයට ගැනීම සඳහා ප්‍රතිසංස්කරණය කිරීම අත්‍යවශ්‍ය බවත් දැනුම් දෙන ලදී. තවද මිල ගණන් වෙනස් වීමත් සමඟ අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.මිලියන 02ක් ප්‍රමාණවත් නොවන බවත් අවම වශයෙන් රු.මිලියන 04ක් හෝ 05ක් අවශ්‍ය වියහැකි බවත් දැනුම් දෙන ලදී. | ඇස්තමේන්තුව සකස් කරන ලෙසත් අවශ්‍ය ප්‍රතිපාදන පළාත් සභාවෙන් ලබා දීමටත් තීරණය විය. | ප්‍රධාන ලේකම් දකුණු පළාත<br><br>ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට |

අද දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තූතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 12.30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2026 මාර්තු මස ......19................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.